# තනතුරු පුරප්පාඩු- කොන්ත්‍රාත් පදනම මත
# කෘෂිකර්ම පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
# හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පත්වීම් ආරම්භයේදී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර,පසුව සේවා අවශ්‍යතාවය මත දීර්ඝ කිරීම සලකා බලනු ලැබේ.

## 1. තාක්ෂණ සහකාර (සිවිල්) - පුරප්පාඩු සංඛ්‍යාව 01

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ) i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් එක් වතාවකදී විෂයයන් හයකින් සමත් වී තිබීම.

සහ

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී ''සාමාන්‍ය පොදු පරීක්ෂණය'' හැර සියලුම විෂයන්ගෙන් සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම ලබා තිබීම.

**වෘත්තීය සුදුසුකම් :**

පිළිගත් ආයතනයකින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

<u>රැකියා විස්තරය</u>

- ආයතනයේ සියලුම ගොඩනැගිලි, බඩු භාණ්ඩ සහ ස්ථාවර උපකරණ දෛනිකව පරීක්ෂා කර බැලීම සහ අඩුපාඩු සොයා බලා සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වෙත දැනුම් දීම.
- නේවාසිකාගාරය සඳහා වෙන් කල ප්‍රදේශය හැර ආයතනයේ භූමිය සහ නිල නිවාස දෛනිකව පරීක්ෂා කිරීම සහ අදාළ කොටස් වලට කාර්යාල වතු කම්කරුවන් රාජකාරී සඳහා යොමු කිරීම.
- සියලුම වැසිකිළි සහ ජලපවාහන නළ දිනපතා පරීක්ෂා කර ඒවායේ පිරිසිදුභාවය සහ මනා ක්‍රියාකාරීත්වය තහවුරු කර ගැනීම.
- ජල සැපයුම, විදුලිය, වායු සමීකරණ සහ දුරකථන පහසුකම් විධිමත් පරිදි නඩත්තු වන්නේද යන්න සහතික කර ගැනීම.
- වායු සමීකරණ යන්ත්‍ර සහ උපකරණ සහ ජල පොම්ප සහ ජල ගබඩා පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සහ නඩත්තු තහවුරු කිරීම.
- ආයතන පරිශ්‍රය තුළ සිටින සියලුම පුද්ගලයින්ගේ සහ දේපල වල ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාමාර්ගවලට වගකිව යුතු වන අතර ආයතනය තුළ රථ වාහන නියාමනය සහ ගාල් කිරීම සම්බන්ධව වගකීමද පැවරේ.
- නඩත්තු සහ ආරක්ෂක රාජකාරී වලට සම්බන්ධ සුලු සේවකයින් අධීක්ෂණය කිරීම සහ එම රාජකාරී කටයුතු වලට අදාලව විධිමත් වාර්තා පවත්වා ගෙන යාම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

- බාහිර ආරක්ෂක ජාලය අධීක්ෂණය කිරීම සහ කිසියම් අඩුලුහුඩුකමක් වෙතොත් සහකාර අධ්‍යක්ෂ (පාලන)/ ලේඛකාධිකාරී වෙත වාර්තා කිරීම.

- සහකාර අධ්‍යක්ෂ (පාලන)/ ලේඛකාධිකාරී විසින් පවරන ඕනෑම රාජකාරියක් ඉටු කිරීමට ද බැඳී සිටියි.

**වයස** : අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 64,760/-

## 2. විගණක සහකාර - පුරප්පාඩු සංඛ්‍යාව 01

<u>අධ්‍යාපන සුදුසුකම්</u>

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් එක් වතාවකදී විෂයන් හයකින් සමත් වී තිබීම.

සහ

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී ''සාමාන්‍ය පොදු පරීක්ෂණය'' හැර සියලුම විෂයන්ගෙන් සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම ලබා තිබීම.

<u>වෘත්තීය සුදුසුකම්</u>**:**

AAT හෝ I.B.K. අවම වශයෙන් අදියර (කොටස්) දෙකක් සමත් වී තිබීම

සහ

ගිණුම්කරණ හෝ විගණන කටයුතු සම්බන්ධයෙන් වසරක පළපුරුද්දක් තිබීම.

**වයස** : අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප** : රු. 64,760/-

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 3. කළමණාකරණ සහකාර (තාක්ෂණ නොවන) - පුරප්පාඩු සංඛ්‍යාව 06

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ) i. සිංහල / දෙමළ
ii. ඉංග්‍රීසි භාෂාව
iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පොෂ. (සා.පෙ) විභාගයෙන් එක් වතාවකදි විෂයයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පොෂ. (උ.පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය" හැර විෂයයන් තුනකින් සමත්ව තිබීම.

**විශේෂ කුසලතා**

පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ හැකියාව
සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි යතුරු ලියනය

**වයස** : අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප : රු. 61,112/-

අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් ද ඥාති සම්බන්ධයක් නැති විස්තර සැපයිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **අධ්‍යක්ෂ, හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 114, විජේරාම මාවත,කොළඹ 07** යන ලිපිනයට **2026.12.01** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි**
**හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**114, විජේරාම මාවත,**
**කොළඹ 07.**
**011 - 2696981**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED